Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව -

| ශ්‍රේණිය - 10 (2 වාරය) | විෂය - නර්තනය | සතිය - ජූනි 02 |
| --- | --- | --- |

1) නිපුණතාව - 5.ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යනය කරමින් ජාතික උරුමය රැක ගනියි.

2) නිපුණතා මට්ටම - 5:3 ශ්‍රී ලාංකේය ගැමිනාටක හා සබැඳි පසුබිම අධ්‍යනය කර සුවිශේෂී ලක්ෂණ ඉදිරිපත් කරයි.

3) පාඩම හෝ ඒකකය - 5:3:1 සොකරි ගැමි නාටකය පිළිබඳව තතු විමසා බලමු.

4) ඉගෙනුම් ඵල -
- ❖ සොකරි නාටකයේ දී භාවිතා කරන රංග භාණ්ඩ නම් කරයි.
- ❖ සොකරි නාටකයේ චරිත වලට අදාළ රංග වස්ත්‍ර නම් කරයි.
- ❖ සොකරි නාටකයේ චරිත වල ස්වභාවයන් විස්තර කරයි.
- ❖ සොකරි නාටකය සංරක්ෂණය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරයි.
- ❖ ''සොකරි ගැමි නාටකය'' නමින් පොත් පිංචක් නිර්මාණය කරයි.

5) ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -
- ❖ සොකරි ජන නාටකයට අදාල සී.ඩී තැටි, වීඩියෝ, පින්තූර නරඹයි.
- ❖ පොත් පත්, පුවත්පත් ලිපි, සඟරා ආදිය පරිශීලනය කරයි.
- ❖ සොකරි ජන නාටකය පිළිබඳව තොරතුරු රැස් කරයි.

පහත දී ඇති කියවීම් පත්‍රිකාව අධ්‍යනය කර ඒ ඇසුරින් කාර්ය පත්‍රිකාවේ දී ඇති ක්‍රියාකාරකම් වල නිරත වන්න.

## කාර්ය පත්‍රිකාව

1. සොකරි නාටකයේදී භාවිතා කරන රංග භාණ්ඩ 03 ක් නම් කරන්න.
2. සොකරි ගේ චරිතය හඳුන්වන්න.
3. වෙදරාල, ගුරුහාමි, පරයා ආදීන් ගේ රංග වස්ත්‍ර මොනවාද? පැහැදිලි කරන්න.
4. සොකරි නාටකය සංරක්ෂණයට ගත හැකි යෝජනා ඉදිරිපත් කරන්න.

5. සොකරි ගැමි නාටකය යන මාතෘකාව යටතේ කුඩා පොත් පිංචක් නිර්මාණය කරන්න.

6. පහත ප්‍රේහේලිකාව සම්පූර්ණ කරන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | ■ | ■ | 2 | න් | |
| ත් | ■ | ■ | ■ | 8 | ■ | ■ | ■ |
| 3 | | ම් | | ට | ■ | 6 | |
| | ■ | ■ | ■ | | ■ | | ■ |
| ■ | ■ | 5 | | ර | | ■ | 9 |
| 4 | | ■ | ■ | | ■ | 7 සේ | |

**හරහට**

1. උඩරට ගැමි නාටකයට අයත් ප්‍රධාන චරිතයකි.
2. සොකරි ගැමි නාටකය ප්‍රචලිත ප්‍රදේශයකි.
3. සොකරි නාටකය සඳහා යොදා ගන්නා තාල වාද්‍ය භාණ්ඩයකි.
4. ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස දවුල යොදා ගන්නා පළාතකි.
5. සොකරි ගැමි නාටකය අයත්වන සම්ප්‍රදාය මේ නමිනි හැඳින්වේ.
6. සොකරියගේ මෙහෙකාරිය හඳුන්වන නමකි.
7. කවි ගායනාවේ සඳහන් පරිදි සොකරි සැරසී සිටින වස්ත්‍ර මෙනමින් හැඳින්වේ.

**පහළට**

1. වෙදරාලගේ පුතා නෙමින් හැඳින්වේ.
6. ගුරුහාමි ලක්දිවට පැමිණීමට පෙර වාසය කළ ප්‍රදේශයයි.
8. සොකරි ගැමි නාටකය සඳහා භාවිතා වන වාද්‍ය භාණ්ඩයයි.
9. සොකරිය කරට පලඳින ආභරණයකි.

6) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත් පත්, Website , LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක.

- ❖ e- තක්සලාව - https://www.e-thaksalawe.mo.go.lk
- ❖ නැණ පියස - Course : 10 ශ්‍රේණිය නර්තන කලාව
- ❖ වෙනත් - Youtube - https://youtube.com/watch?v=Y9j7BIWDBW8
  https://youtube.com/watch?v=RsKAneIhRJo
  https://youtube.com/watch?v=Au69UmKHqzo

කියවීම් පත්‍රිකාව

- සොකරි නාටකය තුළ ගායනයට සුවිශේෂ තැනක් හිමිවේ. ආරම්භයේ සිට අවසානය දක්වා සියලුම සිදුවීම් ගායනය මඟින් විස්තර කරයි.
- සියලුම චරිත ස්වභාවයන් ගායනය තුළින් විස්තර කරයි.
- ගුරුහාමිගේ ඇඳුම වෙස් ඇඳුම් කට්ටලය ඇසුරින් නිර්මාණය කර ඇත. ඉහට පච්ච වඩමක්ද, පයට සිලම්බු ද පළඳා ඇත.
- සොකරිය උඩරට කාන්තාවකගේ ස්වරූපය ගන්නා අතර ඔසරියකින් සැරසී මුදු, මාල, වළලු පළඳා කොණ්ඩය බැඳ සැරසී සිටී.
- පරයා කොට කලිසමකින් හා කමිසයකින්ද, කොළපතකින් සෑදූ වෙස් මුහුණකින්ද, වෙදරාල කොණ්ඩය බැඳ සරම සහ කෝට් බෑය හැඳ සැරසී සිටී.
- <u>**ගුරුහාමි**</u> තරමක් වයස්ගත ඉන්දියාවේ ආන්ද්‍රාදේශයෙන් පැමිණි අයෙකු බව දැක්වීමෙන් ඔහු උඩරට නැටුම් දැක්වීමෙන් පෙනී යන්නේ නර්තනය ප්‍රගුණ කළ අයෙක් බවයි.
- <u>**සොකරිය**</u> රූමත් ලැජ්ජා ශීලිය.
- <u>**පරයා**</u> මොවුන්ගේ අතවැසියා වන අතර මුඛරිය. සොකරිය දෙස ගිජු බැලුම් හෙලයි.
- මෙම ගැමි නාටකය සංරක්ෂණය කර ගැනීම සඳහා
  - ✓ ගැමි නාටක කලාව පිළිබඳව ග්‍රන්ථ රචනා කිරීම.
  - ✓ ගැමි නාටක වල වටිනාකම දක්වමින් ලිපි රචනා කිරීම.

7) අතිරේක පොත් පත් / සඟරා

- ❖ සිංහල නර්තන කලාව - මහාචාර්ය මු. දිසානායක මහතා.
- ❖ 10 ශ්‍රේණිය නර්තනය - ඥානසිරි පීරිස් මහතා.
- ❖ 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත - සෞන්දර්ය අධ්‍යාපන ආයතනය

**සැකසුම - නම - එස්. එම්. ඩී. බී. එස්. කෞශල්‍යා සේනාරත්න**

**අධ්‍යාපන ආයතනය - කෑ/දෙහි/ හුඹස්වලාන ක.වි.**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**